**සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගම - 2017**

-------------------------------------------------------------------------

2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ පාඩු හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශන, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගමේ (''සමාගම'') මූල්‍ය ප්‍රකාශන හා එහි පරිපාලිතයන්හි (''සමූහය'') ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම විගණනය සිදු කිරීම සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරී සමාගමක් මට සහාය විය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුවේ සභාගත කලයුතු යයි මා අදහස් කරනු ලබන සමාගමේ කාර්යසාධනය පිළිබඳ මගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ අන්තර්ගත වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබද අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ (''මණ්ඩලය'') වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ තත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

----------------------------------------------------------------

(අ) 2009 ජූනි 04 දින ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දෙන ලද නඩු තීන්දුව අනුව, සමාගමේ කොටස් වැඩි ප්‍රමාණයක නෛතික අයිතිය ශ්‍රී ලංකා රජය වෙනුවෙන් තබා ගැනීම සඳහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා වෙත පවරන ලදී. තවද එකී නඩු තීන්දුව අනුව, ශ්‍රී ලංකා ඩිස්ටිලරීස්

පී.එල්.සී. සමාගම මෙම සමාගමේ මව් සමාගම ලෙස පැවැති කාල පරිච්ඡේදය තුළ දී ඉපයූ ලාභ ගණනය කර, පෙර මව් සමාගමට ආරෝපිත ලාභ පියවන ලෙසත් භාණ්ඩාගාර ලේකම්ට නියෝග කරන ලදී. ඉහත කී ආරෝපිත ලාභ නිශ්චය වී නොමැති බැවින් මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කර නොතිබුණි.

(ආ) ශේෂ සනාථ කිරීම් නොමැතිවීම හේතු කොට ගෙන, මූල්‍ය ප්‍රකාශනවල සටහන 16 හි හෙළිදරව් කර තිබුණු ශ්‍රී ලංකා ඩිස්ට්ලරීස් පී.එල්.සී. සමූහ සමාගමෙන් ලැබිය යුතු මුදල් ප්‍රමාණයන් පිළිබඳ සම්පූර්ණත්වය, පැවැත්ම හා නිරවද්‍යතාවය මට සත්‍යාපනය කළ නොහැකි විය.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

------------------------------------

තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම දැක්වෙන ඡේදයේ දක්වා ඇති කරුණුවලින් විය හැකි බලපෑම් හැර, සමාගමේ හා එහි පරිපාලනයන්හි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින්, 2017 දෙසැම්බර් 31 දිනට සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

<u>කරුණු අවධාරණය</u>

මාගේ මතය තවදුරටත් තත්ත්වාගණනය නොකරමින් සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගමේ පරිපාලිත සමාගමක් වන සිනො ලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පෞද්ගලික) සමාගම එදිරිව සිදුකෙරෙන බේරුම් කිරීමෙහි ප්‍රතිඵලය සම්බන්ධයෙන් ඇති අවිනිශ්චිතතාවය විස්තර කරනු ලබන මූල්‍ය ප්‍රකාශන වල සටහන් 45.2.1. කෙරෙහි මම අවධානයට යොමු කරමි.

### 2.2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-------------------------------------------------------------------------

අ) 2007 අංක 7 දරණ සමාගම් පනතේ 163(2) වගන්තියෙහි අවශ්‍යතාවය ප්‍රකාරව මම පහත කරුණු දක්වා සිටිමි.

i. මෙම මතය සඳහා පදනම, විගණනයට අදාල විෂය පථය සහ සීමාවන් ඉහත දක්වා ඇති පරිදි බව.

ii. තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම යටතේ විස්තර කර ඇති කරුණුවලට අමතර වශයෙන් මාගේ මතය සඳහා,

- විගණනය සඳහා අවශ්‍ය සියළුම තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර මාගේ පරීක්ෂණයේදී පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් ඇති බව

- සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලින්, 2017 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව

- සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතේ 151 සහ 153 වගන්තීන්හී අවශ්‍යතාවයන්ට අනුකූල බව

ආ) 2011 අංක 03 දරණ රක්ෂණ කර්මාන්ත (සංශෝධන) පනතේ 53 වගන්තිය ප්‍රකාරව, සමාගම විසින් සිදු කරන දිගුකාලීන රක්ෂණ ව්‍යාපාර හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර වෙනම ස්ථාපිත සමාගම් දෙකකට වෙන් කිරීමත්, අවශ්‍ය වුවද මූල්‍ය ප්‍රකාශයන්හි 47 සටහනේ සාකච්ඡා කර ඇති පරිදි සමාගම විසින් එසේ ස්ථාපිත කර නොතිබුණි.

2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්ත පනතේ රෙගුලාසි වගන්ති අංක 47(2) හි අවශ්‍යතාවය ප්‍රකාරව මාගේ පරීක්ෂණයෙන් පෙනී යන්නේ පෙර ඡේදයේ දක්වා ඇති කරුණ හැරුන විට ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් නියම කර ඇති රෙගුලාසි ප්‍රකාරව සමාගමේ මූල්‍ය තත්ත්වය පිළිබඳව සත්‍ය සහ සාධාරණ මතයක් පැහැදිලිව පිලිබිඹු වන ආකාරයට සමාගමේ ගිණුම් වාර්තා නිසියාකාරයෙන් වාර්තා ගත කර ඇති බවයි.

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කලමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සදහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කලමනාකරණ තීරණ ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්ත පනතේ රෙගුලාසි වගන්ති අංක 33 B (1) | සමාගමේ විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකුගේ පත්වීම් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් මේ දක්වා අනුමත කර නොතිබුණි. |
| (ආ) 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්ත පනතේ රෙගුලාසි වගන්ති අංක 89 A | අලාභ ගැලපුම්කරුවෙකු ලෙස ලියාපදිංචි සහතිකයක් නොමැති තැනැත්තෙකු කිසිදු රක්ෂකයෙකුගේ අලාභ ගැලපුම්කරුවෙකු ලෙස කටයුතු නොකල යුතුය. කෙසේ වෙතත් සමාගමෙහි ප්‍රධාන නිලධාරී සාමාන්‍ය (Chief Officer General) සමග කරනු ලැබූ සාකච්ඡාවේදී හෙළිදරව් වූයේ සමාගමේ අලාභ ගැලපුම්කරුවන්, අලාභ ගැලපුම්කරුවන් වශයෙන් කටයුතු කිරීමට ලියාපදිංචි සහතික ලබා ගැනීමට තවමත් කටයුතු කරමින් සිටින බවයි. |
| (ඇ) 2011 අංක 03 දරණ රක්ෂණ කර්මාන්ත (සංශෝධන) පනතේ 53 ඡේදය | සමාගමේ රක්ෂණ ව්‍යාපාර වර්ග දෙක (ජීවිත සහ ජීවිත නොවන) මේ දක්වා වෙනම සැලකීමට භාජනය කර නොමැති අතර එම කටයුතු තවමත් සිදු කරමින් පවතී. |

## 2.4 ප්‍රමාණවත් අධිකාරි බලය නොමැති ගනුදෙනු

වර්ෂය තුලදී කළමනාකාරීත්වය විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියක් නොමැතිව ඔප්පු හිමියන්ට දුන් ණයවලින් රු. 284,213,832 ක මුදලක් බොල් ණය ලෙස කපාහැර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ හා සමූහයේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය පිළිවෙලින් රු.මිලියන 5,890 ක හා රු. මිලියන 8,980 ක බදු පෙර ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ සමාගමේ හා සමූහයේ බදු පෙර ශුද්ධ ලාභය පිළිවෙලින් රු. මිලියන 13,791 ක් හා රු. මිලියන 13,814 ක් වූයෙන් සමාගමේ හා සමූහයේ මූල්‍ය ප්‍රතිඵලවල පිළිවෙලින් රු. මිලියන 7,901 ක හා රු. මිලියන 4,834 ක අඩු වීමක් දැක්වුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

------------------------------------

### 4.1 කාර්ය සාධනය

----------------------

#### 4.1.1. සැලසුම් කිරීම

---------------------

ව්‍යාපාර කරගෙන යාමේ සැලසුම (Business Continuity Plan), ආපදා ප්‍රතිසාධන සැලසුම (Disaster Recovery Plan), තොරතුරු ආරක්ෂණ පිලිවෙත (Information Security Policy) සහ ICT End User ආරක්ෂණ පිලිවෙත (ICT End User Security Policy) කලමනාකරණය විසින් සමාලෝචනය කර, අනුමත කර හා නිමා කර නොතිබුණි.

### 4.2 කලමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------------------

අ) වත්කම්වල ප්‍රයෝජනවත් ආයුකාලය අලුත් කිරීම සහ ගිණුම්වල ගැලපීම් සිදු කිරීම සඳහා කලමනාකරණය විසින් පියවර ගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් රු. 217,095,039 ක සම්පූර්ණයෙන් ක්ෂය කල වත්කම් අවශ්‍ය ගැලපීම් සිදු කිරීමකින් තොරව ප්‍රයෝජනයට ගෙන තිබුණි.

ආ) විගණන කාල සීමාව තුලදී කුලී පදනම මත ලබාගත් පහත දැක්වෙන පරිශ්‍රයන් සඳහා වලංගු ගිවිසුම් නොතිබුණි.

- ජීවිත රක්ෂණ දෙපාර්තමේන්තුව
- සම්පත් බැංකුව
- ජනාධිපති ලේකම් කාර්යාල ගොඩනැගිල්ල

ඇ) වගකීම තීරණය කිරීම සඳහා සාමාන්‍ය සහ ජීවිත රක්ෂණ පද්ධති හරහා ජනනය වන තක්සේරු ලිපිගොනු (TXT ලිපි ගොනු) prophet පද්ධතිය තුලට අතින් ඇතුලත් කරන බව ගිණුම්කරණ ක්‍රමය සඳහා වූ පරික්ෂාවේදී (Walk through test) හඳුනාගන්නා ලදී. කෙසේ වෙතත් තක්සේරු වාර්තා සංස්කරණය කලයුතු බව නිරීක්ෂණය විය.

ඈ) වන්දි විස්තර, ගෙවීම් විස්තර සහ ප්‍රතිරක්ෂණ ආදායම් විස්තර (TXT ලිපිගොනු) BSS රක්ෂණ පද්ධතිය මගින් ජනනය වීම සහ ඒවා පොදු ලෙජරයේ වාර්තා කිරීම සඳහා SAP පද්ධතිය තුලට ඇතුලත් කරනු ලබයි. කෙසේ වෙතත් එම වාර්තා සංස්කරණය කලයුතු බව නිරීක්ෂණය විය.

ඉ) මූල්‍ය ප්‍රකාශනවල සහ බදු වාර්තාවල ඇතුලත් එකතු කල අගය මත බදු සහ ජාතිය ගොඩනැගීමේ බදුවල නිරීක්ෂණය වූ අතර පිළිවෙලින් රු. 53,704,603 සහ රු 10,660,417 ක වෙනස්කම් නිසියාකාරව සහ කාලීනව සසඳා නොතිබුණි.

ඊ) අයකරගැනීම සඳහා කටයුතු කිරීමෙන් තොරව හෝ හානිකරණය කිරීම සඳහා සලකා බැලීමකින් තොරව එකතුව රු. 142,413,864 ක් වූ වර්ෂ 08 කට වඩා පැරණි ලැබිය යුතු ශේෂයක් ගිණුම්වල දක්වා තිබුණි. ඍණ ශේෂයන් දෙකක එකතුව වූ රු. 9,589,066 ක් ඉහත ශේෂය තුල ඇතුලත් වී තිබුණි.

උ) ඉදිරිපෙළ අවසාන පරිශිලකයින් සහ පසුපෙල අවසාන පරිශීලකයින් සඳහා මූල්‍ය දෙපාර්තමේන්තුව තුල වෙනමම පද්ධති දෙකක් සමාගම සතු වේ. මෙම පද්ධති දෙක එකිනෙකට සම්බන්ධ කර නැත. ජ්‍යෙෂ්ඨ මූල්‍ය කලමනාකරු විසින් SAP පද්ධතියට ඉදිරිපෙළ අවසාන පරිශීලකයන්ගේ දත්ත අතින් යාවත්කාලීන කරනු ලබයි. සාමාන්‍යයෙන් ඉදිරිපෙළ අවසාන පරිශිලකයන්ගේ පද්ධතිය සහ පසුපෙළ අවසාන පරිශීලකයින් පද්ධතිය අතර එකගතාවයක් තිබිය යුතු අතර මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් සැසඳීමක් සිදුකිරීම අවශ්‍ය නොවුණි.

දළ ලිඛිත වාරික, වන්දි සහ ප්‍රතිරක්ෂණය යනාදිය සම්බන්ධව සමාගමේ සැසඳීමේ ක්‍රියාවලියේ සංවර්ධනයක් නිරීක්ෂණය විය. කෙසේ වෙතත් ලෙජර් ගිණුම් සහ සසඳන ලද දත්ත සමුදායන් (data bases) අතර වෙනස්කම් පැවතුනි. උදාහරණ පහත පරිදි වේ.

- **වන්දි වියදම් සාමාන්‍ය ලෙජර් ගිණුමේ ශේෂය සහ වන්දි දත්ත සමුදාය අතර වෙනස්කම්**

| | රු |
|---|---|
| ලෙජර් ගිණුම අනුව ශේෂය | 9,998,370,273 |
| සසඳන ලද දත්ත සමුදාය අනුව ශේෂය | 10,024,648,053 |
| වෙනස | 26,277,780 |

- **දළ ලිඛිත වාරික, ජීවිත ලෙජර් ගිණුමේ ශේෂය සහ එහි දත්ත සමුදාය අතර වෙනස**

| | රු |
|---|---|
| ලෙජර් ගිණුම අනුව ශේෂය | 12,517,119,093 |
| සසඳන ලද දත්ත සමුදාය අනුව ශේෂය | 12,467,370,030 |
| වෙනස | 49,749,063 |

- **ලැබිය යුතු වාරික, සාමාන්‍ය ලෙජර් ගිණුමේ ශේෂය සහ ලැබිය යුතු ශේෂ වයස් විශ්ලේෂණය අතර වෙනස්කම්**

| | රු |
|---|---|
| ලෙජර් ගිණුම අනුව වන්දි ශේෂය | 3,291,309,062 |
| සසඳන ලද ණයගැති වයස් විශ්ලේෂණය අනුව ශේෂය | 3,148,919,523 |
| වෙනස | 142,389,539 |

ඍ) පරිණත වන තෙක් තබාගන්නා භාණ්ඩාගාර බැඳුම්කර තක්සේරු කිරීම ලෙජරයට අනුව සහ (held to maturity) ක්‍රමවේදය සහ උපකාරක ලේඛණවල ඇතුලත් තොරතුරු අනුව විගණකගේ ගණනය කිරීම් අනුව ශේෂය අතර වෙනස්කම් දැක්වුනි. මූල්‍යාමය වත්කම් තක්සේරුවේ වූ මෙම වෙනස්කම පහත දැක්වෙන ආකාරයට පොලී ආදායමේද වෙනස්කම් ඇතිවීමට හේතු පාදක විය. කෙසේ වෙතත් මෙම වෙනස්වීම් මූල්‍ය ප්‍රකාශනයන්ට ප්‍රමාණාත්මක නොවන බැවින් එම අගයන් නිවැරදි නොකරන ලද අවප්‍රකාශ යටතේ දක්වමින් විගණනය අවසන් කරන ලදී. විස්තර පහත පරිදි වේ.

| <u>මූල්‍යාමය වත්කම්</u> | <u>රු</u> |
|---|---|
| 2017 දෙසැම්බර් 31 දිනට ලෙජරයේ ශේෂය | 52,472,450,423 |
| විගණකගේ ගණනය කිරීම අනුව ශේෂය (Extrapolated) | 52,703,501,641 |
| වෙනස | 231,051,218 |

| <u>පොලී ආදායම</u> | <u>රු</u> |
|---|---|
| 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා ලෙජරයේ ශේෂය | 5,436,257,173 |
| විගණකගේ ගණනය කිරීම් අනුව ශේෂය (Extrapolated) | 5,300,085,163 |
| වෙනස | 136,172,010 |

ඒ) සමාලෝචිත වර්ෂය සඳහා පහත දැක්වෙන ශේෂයන්ට අදාල සෘජු තහවුරු කිරීම් ලැබී නොතිබුණි.

වෙනත් වත්කම් ජිවිත F1 ගනුදෙනුකරුවන්

| නම | වටිනාකම (රු) |
|---|---|
| සීමාසහිත ලංකා බෙල් (පෞද්ගලික) සමාගම | 43,605,226 |
| උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව | 8,248,008 |
| ජනාධිපති ලේකම් කාර්යාලය, අමීර් ගොඩනැගිල්ල | 141,767,727 |
| සංචාරක සහ ක්‍රීඩා අමාත්‍යාංශය | 5,743,138 |
| සංචාරක සංවර්ධන සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය | 6,348,683 |

ලැබිය යුතු ප්‍රති රක්ෂණය සාමාන්‍ය

| ප්‍රති රක්ෂකයා | 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය (රු) |
|---|---|
| සීමාසහිත ඇක්මේ ඉන්ෂුවරන්ස් සර්විසස් (පෞද්ගලික) සමාගම | 31,161,961 |
| ඇමෙරිකන් හෝම් ඇෂුවරන්ස් සමාගම | 25,310,914 |
| AON බලෙන්ඩ් ෆීල්ඩ් | (34,292,673) |
| සීමාසහිත AON සමූහය | 86,306,167 |
| J.B. බෝඩා (සිංගප්පූරුව) | 1,034,126,032 |
| සීමාසහිත බෝඩා සහ සමාගම (එක්සත් ජනපදය) | (18,729,914) |
| සීමාසහිත JLT රිස්ක් සොලියුෂන් ඒෂියා (පෞද්ගලික) සමාගම | 20,400,400 |
| ජාතික රක්ෂණ භාරකාර අරමුදල | 475,769,466 |
| සූරිච් රක්ෂණ සේවා | 28,227,281 |

## 5. පද්ධති සහ පාලනයන්

---------------------------------

විගණනයේදී නිරීක්ෂණය කරන ලද පද්ධති සහ පාලනවල අඩුපාඩු වරින් වර සමාගමේ සභාපති වෙත දැනුම් දී ඇත. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු විය යුතු වේ.

| පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණය |
|---|---|
| අ) තොරතුරු තාක්ෂණ පරිසරය | තොරතුරු තාක්ෂණ සංවිධාන ව්‍යුහය සකස් කර නොතිබීම<br>තොරතුරු තාක්ෂණ කාර්ය මණ්ඩලය වෙත රැකියා විස්තරය ලබා දි නොතිබීම |
| ආ) තොරතුරු තාක්ෂණ පද්ධති යාවත්කාලින සංවිධානය කිරීම | වින්ඩෝ පද්ධතිය නිසියාකාරව නොකිරීම |
| ඇ) ප්‍රවේශවීමේ අයිතීන් | පරිශීලක ප්‍රවේශ අයිතිය වරින්වර සමාලෝචනය නොකිරීම |
| ඈ) මුරපද (Password) පාලනයන් | කර්මාන්ත ප්‍රමිත සහ ප්‍රශස්ත පරිචයන් අනුව මුරපද හයක් සහ ගිණුම් Lockout settings තුනක් සකස් නොකිරීම |
| ඉ) බැකප් ක්‍රියාවලිය | බැකප් ටේප් කොළඹ 02 යූනියන් පෙදෙසෙහි පිහිටි ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ පවත්නා සේප්පුවක |

| | |
|---|---|
| | දෛනිකව තැන්පත් කර තිබෙන බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත් මෙම ස්ථානය ප්‍රධාන කාර්යාලයේ සිට කිලෝමීටර් 10ක් ඇතුලත පිහිටා තිබෙන බව හඳුනාගත හැකි විය. |
| ඊ) වෙනස් වන උපාය (Change Management) | HRIS පද්ධතියේ සිදුකරන ලද පද්ධති වෙනස් කිරීම් සඳහා පරිශීලක පිළිගැනීම් පරීක්ෂාවන් (UTA) ප්‍රායෝගිකව සිදුකරන බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත් පරිශීලක පිළිගැනීම් පරීක්ෂාවන්හි ප්‍රතිඵල ලේඛණගත කර නොතිබුණි. |